නිහාල් ශ්‍රී අමරසේකර, පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්හි මනා ලෙස අත්දැකීම් සහිත, බහු-විනය වෘත්තීයමය විශේෂඥයකු මෙන්ම, ජාත්‍යන්තර පුළුල් අත්දැකීම් වලින් අනූන, ශ්‍රී ලංකාව තුළ මහජන උන්නතිය සහ යහපත උදෙසා පෙනී සිටින ක්‍රියාකාරිකයකු වේ. නීතිමය වෘත්තිකයකු නොවුවද, ඔහු ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පෞද්ගලිකව ඉදිරිපත්ව, පෙනී සිටිමින්, මහජන සුභ සිද්ධින් සහ අයිතීන් වෙනුවෙන් සහ ඉට අමතරව මානව හිමිකම් සහ සිවිල් සමාජ වගකීම් පිළිබඳ නඩු ගොනු කරමින්, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ තර්ක කරමින් සාර්ථකව ජය ලබා ගෙන ඇත. ඔහු මූල්‍ය ගිණුම්කරණ විමර්ශණාත්මක ගවේෂණ විශේෂඥයෙක් වේ. ඔහු ගැඹුරු හෙළිදරව් කිරීම් පුළුල් ලෙස ප්‍රකාශයට පත් කර, කැපවීමෙන් ජාතික සහ මහජන උන්නතිය සඳහා නිර්භීත ලෙස ඉදිරිපත් වන කථිකයෙකි. එසේම ඔහු මහජන දේපල හා මූල්‍ය, ජනතාවගේ පමණක් බව පාරිශුද්ධ නියමයක් ලෙස ඉමහත් ලැදියාවකින් සනාථ කරමින්, රජය විසින් ඒවා පාලනය කළ යුත්තේ භාරකාර විශ්වාසනීය කළමනාකරණයක් ලෙස බව හුවා දක්වමින්, එම යථාර්තය උල්ලංඝනය කිරීම් වලට එරෙහිව කැපවීමකින් සටන් වැදුණු, ප්‍රබල දේශපාලනඥයින්, රාජ්‍ය නිලධාරීන් සහ ව්‍යාපාරිකයින්ට එරෙහිව නිර්භීතව නැඟී සිටි පුද්ගලයෙකි. ඒ අතර, සමාජයේ සුදනන් ලෙස පෙනී සිටිමින්, සමාජයේ ගිවිසුම්ගත සේම සමාජයට පවතින බැඳීම් පැහැර හරිමින් කටයුතු කරන වෘත්තිධාරීන් පිළිකුල් ලෙස හෙලා දැකීමටද කටයුතු කර ඇත.